

1. දුකට හේතුව සහ එහි බලපෑම

දෙවියන්වහන්සේ විශ්වය සහ එහි ඇති සියලු දේ දින පහකින් මවා, හයවන දින පොළොවේ දූවිල්ලෙන් උන්වහන්සේ පළමු මිනිසා සහ ස්ත්‍රිය මවා මිනිසාට "ආදම්" කියාත් ස්ත්‍රියට "ඒව" කියාත් නම් තැබූ සේක. මෙය පොළොවේ සිදුවූ පළමු විවාහ මංගල්‍යයි. උන්වහන්සේ මෙම පවුලට මෙසේ අණ කල සේක "නුඹලා බෝවී වැඩිවෙමින් පොළොවේ පූර්ණ වන්න"
ඒදන් නම් උයනක උන්වහන්සේ ආදම් සහ ඒවට අවශ්‍ය සියලුම සම්පත් තබා ඔවුන් එහි පිහිටෙවූ සේක. එම උයනේ විවිධ ගස් වර්ග තිබුණු අතර ජීවන ගස සහ යහපත සහ නපුර දැන ගැනීමේ ගසද තිබුණි. ජීවත් වීම සඳහා මිනිසාට සතුන් මැරීමට අවශ්‍යතාවයක් නොතිබුණි. ආදම් සහ ඒව නිර්වස්ත්‍රව සිටි නමුත් ඔවුන් ලැජ්ජාවට පත්වූයේ නැත. සෑම සැඳෑ යාමයකදීම මැවිල්ලේ දෙවිදුන් ආදම් සහ ඒව සමග මිතුරන් ලෙස කතා බහ කරමින් ඒදන් උයනේ සක්මන් කල සේක.

සර්පයා වනයේ කවර සත්වයෙකුටත් වඩා කපටි සහිත වූයේය. (මෙම සර්පයා සැබවින්ම දුෂ්ඨ සාතන්- **'මාරයා ය**) දවසක් ඔහු ඒවගෙන් ඇසුවා

"මැවිල්ලේ දෙවිදුන් ඔබට උයනේ ඇති සියලුම ගස්වලින් කන්න ඉඩ දෙනවාද?"

"ඔව්, අපිට උයනේ ඇති සියලුම ගස්වලින් කන්න පුලුවන් නමුත් යහපත(කුසල්) සහ නපුර(අකුසල්) දැන ගැනීමේ ගස හැර. දෙවියන්වහන්සේ අපට එම ගස අත ගැසීමට හෝ කෑමට තහනම් කර ඇත. එහෙම කලොත් අපි නසින නිසාය(තණ්ණාව ඇතිවන)."

"ඒක ඇත්තක් නොවේ! නුඹලා නසින්නේ නැත. දෙවියන්වහන්සේ දන්නවා නුඹලා ඉන් කෑවොත් උන්වහන්සේ මෙන්, [2]පරම සත්‍ය දැන නිර්වාණවබෝධයට පත්වෙන බව."

ස්ත්‍රිය එම ගසේ පලතුර බැලුවාය. එය බැලූ බැල්මට අලංකාර ඉතා රසවත්ව පෙනුනි. ඇය සිතුවා " මා මෙය අනුභව කලොත් මෙයින් මා [21] නිර්වාණයට පත්කරයි" එසේ ඈ පලතුර අනුභව කර පසුව ඉන් ස්වල්පයක් ආදම්ට දුන් අතර ඔහුද එය කෑවේය. ඉන් අනතුරුව ඔවුන් අවබෝධ කරගත්තා ඔවුන් නිර්වස්ත්‍රව සිටින බව. වහාම ඔවුන් කොළ කිහිපයක් එකට මසා ඔවුන්ගේ ලැජ්ජාව වසාගත්තෝ ය.

සැඳෑ යාමයේ දී දෙවියන් වහන්සේ උයනේ සක්මන් කරන බව ඔවුන්ට ඇසුණේ ය. ඔවුන් දෙවියන් වහන්සේට බියෙන් වනයේ ගස් අතර සැඟවුණෝය.

දෙවියන්වහන්සේ කතා කරමින් "ආදම්, නුඹ කොහෙද සිටින්නේ?"

ආදම් උත්තර දෙමින් "ස්වාමිනි, ඔබ වනයේ සක්මන් කරන ශබ්දය ඇසුණු සැනින් මම නිර්වස්ත්‍රව සිටින නිසා බිය වී වනයේ ගස් අතර සැඟවුනෙමි."

උන්වහන්සේ "නුඹ නිර්වස්ත්‍ර බව නුඹට කීවේ කවුද? මා තහනම් කළ ගසෙන් අනුභව කලෙහිදැයි? ඇසූසේක."

ආදම් "මා සමඟ සිටින්ට ඔබවහන්සේ දුන් ස්ත්‍රී ගහෙන් මට දුන්නාය, මමද කෑවෙමියි."

දෙවියන්වහන්සේ ඒව දෙසට හැරී "නුඹ ඇයි මෙසේ සිදු කලේ යැයි" ඇසූසේක. "එය සර්පයාගේ වරද! සර්පයා මා රැවටුවේය, මමද පළතුරු කෑවෙමි"

දෙවියන්වහන්සේ සර්පයා දෙසට හැරී "නුඹ මේ දේ කළ නිසා, වනයේ සියලු තිරිසනුන්ටත්,
සත්වයන්ටත් වඩා නෝ ශාප ලද්දෙක්ය. අද පටන් නුඹ බඩගායමින් තාගේ ජීවිතයේ සියලු දවස්වලම ධූලි කන්නෙහිය. නුඹ සහ ස්ත්‍රිය අතර වෛරයක් ඇති කරමි, දෙදෙනාගේම පරම්පරා අතර සටනක් වන්නේ ය. ඔහු නුඹේ හිස පොඩි කරන සේක, නුඹ ඔහුගේ විලුඹ පොඩි කරනු ඇත."

දෙවියන් වහන්සේ ස්ත්‍රිය දෙස ආපසු හැරී, "නුඹ වේදනා සහිතව දරුවන් බිහි කරන්නෙහි ය. නුඹ නුඹේ සැමියා පාලනය කිරීමට ප්‍රියවන, නමුත් අද පටන් නුඹව පාලනය කරනු ඇත, ඔබ මිනිසාට ආශා කරනු ඇත."

දෙවියන් වහන්සේ ආදම්ට පැවසු සේක් "එම ගසෙන් අනුභව කිරීම තහනම් කල නමුත් නුඹ අකීකරු වූ නිසා භූමිය නුඹ නිසා දුක් විඳිනවා ඇත. මෙතැන් සිට, නුඹ නුඹේ ආහාර සඳහා වැඩ කරනු ඇත, එවිට භූමිය නුඹට විරුද්ධවනු ඇත. එය කටු සහ වල් පැලෑටි උපදවන්නේය. දුවිල්ලෙන් ගත් නුඹ දුවිල්ලටම යනතෙක් දහඩිය සමඟ වෙහෙස මහන්සි වී වැඩ කිරීම, නුඹේ ජීවිතය සලකුණ වන්නේය."

දෙවියන් වහන්සේ ආදම් සහ ඒව සතෙකුගේ සමෙන් සාදන ලද ඇඳුම් වලින් ඇන්දවූ සේක. ඉන්පසු ආදම් සහ ඒව වගා කල එම උයනෙන් දෙවියන් වහන්සේ ඔවුන් පිටතට යැවූ සේක.

දෙවියන් වහන්සේ උයනෙන් පිටත ආරක්ෂක **සුරදූතයෙක්** තැබූහ. එදින සිට, මිනිසුන් ජීවන ගසෙන් වෙන් විය.
මෙසේ දුක්ඛ දෝමනස්සයන් සහ මරණයේ උපත සිදු විය.




2. කරුණාවේ ස්වාමින්ගේ උපත

ඊශ්‍රායෙල් නම් දේශයේ මරියා නම් ලත් කනත්‍යා ස්ත්‍රියකට [3]**සුරදූතයෙක්** පෙනුනේය

මීට වසර 2,021 කට පෙර, එනම් බුදුන් වහන්සේගෙන් වසර 563 කට පසුව. ඊශ්‍රායලය නම් දේශය නිරිතදිග ආසියාවේ පිහිටා තිබුණේ ය. නමුත් එකල රෝම අධිරාජ්‍යයේ ව්‍යාප්තිය සමග ඊශ්‍රායලය රෝම හමුදාවේ අනුකම්පා විරහිත සහ පීඩාකාරී පාලනයට යටත් විය. එම දේශයේ මරියා නම් ලත් කනත්‍යා ස්ත්‍රියකට [3]**සුරදූතයෙක්"** පෙනුනේය. මරියා යෝසෙප් නම් පුද්ගලයා සමඟ විවාහ ගිවිස ගෙන තිබුණා ය. සුරදූතයෙක් ඇයට මෙසේ කීවේය. "මරියා, ඔබ දෙවියන් වහන්සේගෙන් ආසිරි ලැබ ඇත." එම ආමන්ත්‍රණය නිසා ඇය කම්පා විය කුමක් පවසන්න ද? කියා නොදැන සිටියා ය. "බිය නොවන්න, නුඹ දෙවියන් වහන්සේගෙන් කරුණාව ලබා ඇත. නුඹ පුත්‍රයෙකු බිහි කරන්නෙහි ය. ඔහුට යේස්ණුවා යන නාමය තබන්න. ඔහු උතුම් පුද්ගලයෙකු වන අතර ඔහුගේ රාජ්‍යයට කෙළවරක් නැත්තේය." මරියා පිළිතුරු දෙමින් "මෙය සිදු වන්නේ කෙසේ? මම කනත්‍යා ස්ත්‍රියක් වෙමි." [3]**සුරදූතයෙක්** ඇයට මෙසේ කියමින් "මැවීමේ දෙවිදුන්ගේ බලයෙන් නුඹට දරුවෙකු ලැබෙනු ඇත. එබැවින් දරුවා දේව දරුවා යැයි කියනු ලබන්නේ ය. මේ දරුවා සාමාන්‍ය දරුවෙකු නොවන අතර ඔහුගේ රුධිරය පළමු කාන්තාව වන ඒවගෙන් පැවත එන්නේ නැත. නමුත් මොහු [22]**නිර්වාණ** නගරයෙන් විය. [3]**සුරදූතයෙක්** ඇයට මෙසේ කියමින් "මරියා, සියල්ල දෙවියන් වහන්සේ ට පුළුවන් ය." මරියා එකඟ වී හිස නමා, "මම ස්වාමීන්ගේ සේවකයා ය. ඔබ කී ලෙසම මෙය සිදු වේවා. " යැයි කීය.

ඉක්මනින්ම, මරියා විවාහ ගිවිසගෙන සිටි ජෝසප් ඇය ගැබ්ගෙන ඇති බව දැන සහ ඔහු පියා නොවන බවද දැන සිටියේය. නමුත් ඔහු ධාර්මික මිනිසෙක් විය. ඔහු මරියා නින්දාවට නොපමුණුවා නිහඬව ඈ අත් හැරීමට තීරණය කලේය. ඔහු මේ ගැන ගැඹුරින් කල්පනා කළ විට [3]**සුරදූතයෙක්** ඔහුට සිහිනයකින් පෙනී "යෝසෙප්, බිය නොවන්න මරියා ඔබේ බිරිඳ කරගන්න. ඇය දරා සිටින දරුවා දෙවියන් වහන්සේගෙන් ය. ඔහු ඉපදුනු පසු ඔහුට **යේෂුවා** යන නාමය තබන්න. මන්ද ඔහු **පෘතග්ජනයින් දුකෙන්** මුදවා ගනී." ඉක්බිති යෝසෙප් මරියා සමග විවාහ විය. ඒ අවදිය වන විට රෝම හමුදාව මුළු ඊශ්‍රායෙල් සෙනඟට ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේ ගම් බිම් බලා පිටත්ව යෑමට

උපදෙස් දී තිබුණි. යෝසෙප් සහ ඔහුගේ බිරිඳට බෙත්ලෙහෙම් ගම්මානයට බොහෝ දුර යාමට බල කෙරුනි. මන්ද රෝම හමුදාවට පවුල් සංගනණය කිරීමට අවශ්‍යව තිබුණි.

මෙම ගමන සිදුවන අතර මරියාට තම ප්‍රසූති කාලය ආසන්න ව තිබුණි. යෝසෙප් සහ මරියාට බෙත්ලෙහෙමේ නෑදෑ හිත මිතුරන් සිටියේ නැත. නොසිතූ ලෙස ඔවුන් එහි යන විට සියලුම නවාතැන් පිරී තිබුණි. එබැවින් යෝසෙප් ඔවුන්ට රාත්‍රිය ගත කිරීමට ගව මඩුවක් සොයා ගත්තේය. එම රාත්‍රියේ දී මරියා තම දරුවා බිහි කළාය. **ගැළවුම්කරුවා(මෛත්‍රී බුදුන්)** උපත ලැබීය. මරියා දරුවා රෙදි පටිවලින් ඔතා ගවයන් කන ඔරුවක බාවා තැබුවා ය. එදිනම රාත්‍රියේ එඬේරුන් තම රැළ අසල තණ බිමක බලා සිටියහ. හදිසියේ ඔවුන් අතරට" [3]**සුරදූතයෙක්** පැමිණීමත් සමග, අහස දීප්තිමත් ආලෝකයෙන් බැබලෙන්නට විය. එම එඬේරුන් බියට පත් විය. නමුත් [3]**සුරදූතයෙක්** පැවසුවේ "බිය නොවන්න. මම ඔබට සුබ ආරංචියක් ගෙන ඒමට මෙහි පැමිණ ඇත! ඉන්පසු ඔහු අසල තිබූ ගම දෙසට ඇඟිල්ල දිගු කොට "අද රාත්‍රියේ බෙත්ලෙහෙම් නගරේ **ගැළවුම්කරුවා(කරුණාවේ ස්වාමීන්)** උපන්නේ ය. ඔහු **මෙසියා ය (මෛත්‍රී බුදුන්)**. එහි ගොස් ගව ඔරුවක රෙදි පටිවලින් ඔතා තබා තිබෙන ළදරුවා ව බලන්න." එකෙණෙහිම මුළු අහසම 'සුරදූතයන්ගෙන් පිරී මැවිල්ලේ දෙවිදුන්ට ප්‍රශංසා කරමින් ගායනා කළෝය, "ඉතා උසස්තැන්හි දෙවියන්වහන්සේට මහිමයද පොළොවෙහි උන්වහන්සේට ප්‍රියවූ මනුෂ්‍යයන් අතරෙහි **මෛත්‍රියද** වේවයි" කීවෝය. පසුව," [3]**සුරදූතයන්** අතුරුදහන් විය. එඬේරුන් වහාම [3]**සුරදූතයෙක්** කී ලෙසම ඔවුන් බෙත්ලෙහෙමට ගොස් මරියා, යෝසෙප් සහ ළදරුවා හමු විය. එදින රාත්‍රියේ සිදු වූ දේ එඬේරුන් ඔවුන්ට පැවසූ අතර සියල්ලෝම මවිතයට පත් වූහ. පසුව, ඔවුන් දුටු දේ ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් තම තණ බිම්වලට ආපසු ගියෝ ය. නැගෙනහිර ආසියාවේ, සමහර විට ඉන්දියාවේ තක්ෂිලාවෙ සිට පැමිණි ප්‍රඥාවන්ත පඬිවරු මතු පැමිණෙන කරුණාවෙ ස්වාමීන්වහන්සේ ගැන අසා බටහිරට, ඊශ්‍රායලයට පැමිණියේ මෙසියස්(මෛත්‍රී බුදුන්) සොයමිනි. ඔවුන් නැගෙනහිර දෙසින් විශේෂ තාරකාවක් අනුගමනය කලෝය. එම තාරකාව **යේෂුවා**(කරුණාවෙ ස්වාමීන්) උපන් ඊශ්‍රායෙලට මග පෙන්වන ලදී.

පඬිවරුන් රෝම හමුදා ආණ්ඩුකාරවරයාගෙන් සහ ඔහුගේ අමාත්‍යවරුන්ගෙන් මෙසියස් ඉපදෙන්නේ කුමන ප්‍රදේශයේද යන්න විමසුවෝ ය. මෙම ගැළවුම්කාරයා(යේෂුවා) ඊශ්‍රායලයේ රජු සහ ලෝකයේ රජු වන බවට දිවැස් වැකි පළවී තිබුන නිසා ආණ්ඩුකාරවරයා පැමිණෙන ගැළවුම්කරුවාට(යේෂුවා) ඊර්ෂ්‍යා කළේය. මෙසියස් සහ ක්‍රිස්තුස් යන වචනයේ තේරුම "අභිෂේක ලත් තැනැත්තා" යන්නයි. ඔහු බිළිඳාව මරා දැමීමට හමුදාව යැවූ නමුත් **සුරදූතයෙක්** යෝසෙප්ට සිහිනයකින් අනතුරු අඟවා අප්‍රිකාවේ අසල්වැසි ඊජිප්තුවේ රැකවරණය ඔවුන් ලැබීය. එම ප්‍රඥාවන්ත පඬිවරු **යේෂුවාව** සොයාගත් විට, ඔවුන් රන්, සුවඳ දුම් සහ සුවඳලාටු ගෙනැවිත් උන්වහන්සේට නමස්කාර කළහ.



3

## 3. යේෂුවා කරුණාව උගන්වයි..

**ලූක් 10:25-37**

එක් ප්‍රස්තාවක නීතිය පිළිබඳ විශාරදයෙක් **යේෂුවා** පරීක්ෂා කරමින්. "ගුරුතුමනි, **නිර්වාණයට** පත්වීමට මා කුමක් කළ යුතුද?

**යේෂුවා** පිළිතුරු දෙමින් "**ධර්මයේ** ලියා ඇත්තේ කුමක් ද? ඔබ එය කියවන්නේ කෙසේ ද?"

ඔහු පිළිතුරු දෙමින්, "ඔබේ මුළු හදවතින්ම, ඔබේ මුළු ආත්මයෙන්, ඔබේ මුළු ශක්තියෙන් සහ ඔබේ මුළු මනසින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ **මෛත්‍රී** කරන්න. ඔබට මෙන් ඔබේ අසල්වැසියාට **කරුණා** කරන්න."

"ඔබ නිවැරදිව පිළිතුරුදී ඇත," **යේෂුවා** පිළිතුරුදුන්නේය. "මෙය කරන්න එවිට ඔබ **නිර්වාණයට** පත්වනු ඇත."

නමුත් ඔහුට තමාව සාධාරණීකරණය කිරීමට අවශ්‍ය වූ අතර, ඔහු යේෂුවාගෙන්, "මගේ අසල්වැසියා කවුද" කියා ඇසුවේය.

**යේෂුවා** උත්තර දෙමින් " එක්තරා මිනිසෙක් යෙරුසලමේ සිට යෙරිකෝවට යමින් සිටියදී මංකොල්ලකරුවන්ගේ ප්‍රහාරයට ලක් විය. ඔව්හු ඔහුගේ ඇඳුම් ගලවා, ඔහුට පහර දී, ඔහු අඩ පණ කර ගියහ. උත්තම පූජකයෙක් එම මාර්ගයේම ගමන් කරමින් සිටි අතර, අඩ පණ වූ පුද්ගලයා දුටු විට ඔහු අනෙක් පැත්තෙන් ගියේය. එසේම, ධර්ම ශාස්තෘන් වහන්සේ නමක් එම ස්ථානයට පැමිණ අඩ පණ වූ පුද්ගලයා දැක අනෙක් පසෙන් ගමන් කළහ. එහෙත්, සාමාරීය ජාතිකයෙක් ඔහු ගමන් කරමින් සිටි තැනට පැමිණියේ ය. අඩ පණ වූ පුද්ගලයා දැක ඔහු කෙරෙහි අනුකම්පා (මුදිතා) ඇති විය. (සමරිතානුවන් සමාන වූ නමුත් ඊශ්‍රායලයේ යුදෙව්වන් විසින් හෙළා දකින ලදී)

සාමාරියයා අඩ පණ වූ පුද්ගලයා ළඟට ගොස් ඔහුගේ තුවාලවලට බෙහෙත් බැඳ සාත්තු සප්පායම් කළේය. ඉන්පසු ඔහු තම බූරුවා පිට තබා ඔහුව තානායමකට ගෙනැවිත් බලාගත්තේය. ඊළඟ දවසේ ඔහු කාසි දෙකක් (දින දෙකක ගෙවීම්) ගෙන තානායම් හිමියාට දුන්නේය. සාමාරියයා පවසමින් 'ඔහුව හොඳට බලාගන්න, මම ආපසු පැමිණි පසු, ඔබට වුනු අමතර වියදම් මම පියවන්නෙමි."

"මේ තුන්දෙනාගෙන් ඔබ හිතන්නේ කවුද අසල්වැසියෙක් කියලා මංකොල්ලකාරයන් අතට පත් වූ මිනිසා?"

එවිට නීතිය පිළිබඳ විශාරදයා පිළිතුරු දුන්නේ, "ඔහුට මුදිතා කල සහ පෙන්වූ තැනැත්තා ය" යනුවෙනි. **යේෂුවා** ඔහුට කතා කොට, "ගොස් එලෙසම කරන්නැ"යි වදාළ සේක.


4

## 4. පාපකර්මය සිටින්නන්ට නිර්වාණවබෝධය ලබාදීමට යේෂුවා කතා කරයි
## ලූක් 19:01-10

**යේෂුවා** යෙරිකෝවට ඇතුල් වී ඒ මැදින් ගමන් කරමින් සිටියදී, සාකෙවුස් නම් වූ මනුෂ්‍යයෙක් සිටියේය. ඔහු බදු එකතු කරන්නන්ගේ ප්‍රධානියා සහ ධනවත් මනුෂ්‍යයෙක් විය. **යේෂුවා** කවුද කියා බැලීමට ඔහුට අවශ්‍ය විය. නමුත් ඔහු මිටි පුද්ගලයෙකි. මහත් සෙනගක් පිරිවරා සිටි හෙයින් **යේෂුවා** කවුදැයි බැලීමට බැරිවිය. ඒ නිසා ඔහු දුව ගොස් බලන පිණිස අසල තිබුනු අත්තික්කා ගසට නැග්ගේය. **යේෂුවා** ඒ අසලට පැමිණි සේක.

ගස උඩ බලා මෙසේ පැවසූ සේක "සාකෙවුස් ඉක්මනින් බසින්න මම අද නුඹේ නිවසේ නතර වෙන්න එනවා" ඒ විගසම ඔහු පහළට පැමිණ උන් වහන්සේ ප්‍රීතියෙන් පිළිගත්තේය.

සියලුම පිරිස මෙය දැක කොඳුරමින් "උන්වහන්සේ **පෘතග්ජන** පවුකාර මනුෂ්‍යයෙකුගේ නිවසට ආගන්තුකයකු ලෙස ගිය සේක" යැයි පැවසුවෝය.

නමුත් සාකෙවුස් නැගිට **යේෂුවාට** මෙසේ පවසමින් "ස්වාමීන් වහන්සේ මම මාගේ වස්තුවෙන් සහ ධනයෙන් භාගයක් දුප්පතුන්ට බෙදා දෙන්නෙමි. මම යමෙකුට වංචාවක් කර ඇත්නම් ඒ තැනැත්තාට සතර ගුණයෙන් දෙන්නෙමි" යි පැවසුවේය.

**යේෂුවා** එයට උත්තර දෙමින් "අද මේ නිවසට **නිවන් අවබෝධ(ගැලවීම)** විය. මන්ද මේ **පෘතග්ජනයා** ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි. **යේෂුවා** (මනුෂ්‍ය පුත්‍රයා) මේ ලෝකයට ආවේ **නිර්වාණාවබෝධය** ලබා දීමට සහ අනන්තර්ය පාප කර්මයෙන් නිවන් මගට ගෙන ඒමටයි.



## 5. යක්ෂ, ප්‍රේතයන්, නපුරන් කෙරෙහි යේෂුවාගේ බලය
## ලූක් 8:26-39

**යේෂුවා** සහ ඔහුගේ ගෝලයින් ඔරුවකින් යක්ෂාවේශ වූ මනුෂ්‍යයකු වාසය කරන සොහොනකට පැමිණියෝ ය. කිසිදු මනුෂ්‍යයකුට ඔහුව පාලනය කරන්නට නොහැකි විය. ඔහු බොහෝ වර දම්වැල් වලින් බැඳ දැමුවද ඉතා ලේසියෙන් ඒවා කඩා දමා ඒ මනුෂ්‍යන්ට පහර දුන්නේ ය. ඔහු තමාගේ ශරීරයට වද හිංසා දෙමින් නිර්වස්ත්‍රව සොහොන් ගෙදර වාසය කළේ ය.

ඔහු **යේෂුවා** දුටු විට උන්වහන්සේ ළඟට දුව ගොස් දණින් වැටී මොරගසමින් "මම දන්නවා ඔබවහන්සේ කවුරුන්ද කියා ඔබ **යේෂුවා** දෙවිඳුන්ගේ(ශක්‍රයා) පුත්‍රයා ය. මට තනියම ඉන්න දෙනු මැනවි මට කරදර නොකරන්න" යැයි පැවසුවේ ය.

**යේෂුවා** මෙසේ පවසමින් "නුඹේ නම කුමක්ද?" ඔහු පිළිතුරු දෙමින් "අපි **ලෙගියොන්(සමූහයක්)** අපිව නිරයට(පාතාලයට/ අපායට) යවන්න එපා. බලන්න අතන ඌරන් රැලක් ගැවසෙමින් සිටී, අපට එතැනට යෑමට අවසර දුන මැනවි". යේෂුවා ඌරන් දෙස බලා "නුඹලා එතැනට යන්න" යැයි පැවසූ සේක.

ඒ මොහොතේ සිට යක්ෂයන් ඒ මනුෂ්‍යයා කෙරෙන් ඉවත් වී (දුරු වී) ගොස් ඌරන්ට ආවේශ විය. ඌරන් දෙදහක් පමණවූ රැල ප්‍රපාතය දිගේ වේගයෙන් දිව ගොස් මුහුදේ ගිලී මළෝ ය. එය දුටු මනුෂ්‍යයන් නගරයට ගොස් සිදු වූ සියල්ල පැවසුවෝ ය. සිදුවූ දේ බලන පිණිස පැමිණි සියලු දෙනාම යක්ෂාවේශ වූ මනුෂ්‍යයා සිහි ඇතුව ඇඳුම් ඇඳ **යේෂුවාට** ඇහුම්කන්දී ගෙන සිටින අයුරු දුටුවෝය. මනුෂ්‍යයා සිදුවූ දේ පැමිණ සිටි සෙනඟට පැවසුවේය. එවිට ඔවුන් බයට **යේෂුවාට** එම ස්ථානයෙන් පිටත්ව යන ලෙස පැවසුවෝය.

**යේෂුවා** ඔරුවට ගොඩ වනවිට මනුෂ්‍යයා පැමිණ "ඔබ සමග එන්නද" යැයි ඇසුවේය. **යේෂුවා** මෙසේ පිළිතුරු දෙමින් "යන්න.. ගොස් නුඹට සිදු වූ යහපත ගැනත් ස්වාමීන් වහන්සේ නුඹට දැක් වූ **මෛත්‍රිය** ගැනත් අන් අයට ප්‍රකාශ කරන්නැ"යි කීසේක.

**යේෂුවා** එතැනින් ගිය පසු ඒ මනුෂ්‍යයා යුදෙව්වන් සහ ඔහුගේ ගමට පැමිණ සිදු වූ සියල්ල ගැනත් **යේෂුවා** ඔහුට දැක්වූ **මෛත්‍රිය** ගැනත් ප්‍රකාශ කළේ ය.


6

## 6. යේෂුවා ස්වාමීන්වහන්සේ පන්දහසකට කෑම දීම
## යොහාන් 6:01-15

මින් ටික කාලයකට පසු **යේෂුවා** ගලීලයේ මුහුද හරහා එගොඩට ගියේය. බොහෝ මනුෂ්‍යයන් උන්වහන්සේ අනුව ගියෝ ය. ඔවුන් සිදුවූ බලවත් සහ පුදුම දේ ගැනත්, රෝගාතුරයන් සුවපත් කළ ආකාරයත් දුටුවෝය. **යේෂුවා** ස්වාමීන් වහන්සේ කන්දකට නැග තමන් ගෝලයන් සමඟ හිඳ ගත්තේය.

මහත් සමූහයක් **යේෂුවා** සමග පැමිණෙන බව දැක උන් වහන්සේ තම ගෝල පිලිප්ට කතා කොට "මේ සෙනඟට කෑම මිලදී ගන්නේ කෙසේද?" යැයි උන් වහන්සේ ඇසූ සේක.

මක්නිසාද **යේෂුවාගේ** දිව්‍ය ඥාණයට ඔහු කිරීමට යන දේ දැන සිටි සේක. පිලිප් උත්තර දෙමින් "මොවුන් හැමෝටම ටික ටිකවත් කෑමට දීමට නම් මසු දෙසීයක් වත් අවශ්‍ය වේ" යැයි පැවසුවේය. සීමොන් පේදුරුගේ සහෝදරයා වූ ඇන්ඩෘ කතා කොට "කුඩා දරුවෙකුගේ දවල් ආහාරයට රොටී පහක් සහ මාළු දෙකක් ගෙනැවින් තිබේ නමුත් මෙපමණ දෙනෙක්ට එය නොසෑහේ" යැයි පැවසුවේය.

**යේෂුවා** සියල්ලන්ට තණබිමේ හිඳු වන ලෙස තම රැගෙන සෙත්කර ආවඩා ඉඳගෙන උන් අයට බෙදා ගෝලයන්ට පැවසූ සේක. රොටී පහක් සහ මාළු දෙක දුන්නේ ය. ඔවුන් සියල්ලන්ටම කුසගිනි නිවෙන  තරමට කෑමට හැකි විය. වැඩිපුර කුඩ 12ක්ද ඉතිරි විය. මිනිසුන් **යේෂුවාගේ** මේ ප්‍රාතිහාර්යය දැක "මොහු සැබෑවටම මෛත්‍රී බුදුන් ය. උන්වහන්සේ මේ ලෝකයට වැඩීමට සිටි සේකැ" යි පැවසුවෝය. එබැවින් ඔවුන් රජකමට බලෙන් පත් කර ගන්නා පිණිස **මෛත්‍රිය බුදුන්ව** අල්ලා ගැනීමට එන බව දැන උන් වහන්සේ එතැනින් ඉවත්ව කන්දකට ගිය සේක.



## 7. යේශුවාව කුරුසියේ ඇණ ගැසීම
## ලූක් 23: 1-56

**යේශුවා** තමන්ට සිදු වෙන්නට තිබෙන දේ ගැන අනාවැකි පළකර තිබුණේය. එනම් ඔහුව පාවා දෙනු ලබන බවත්, යුදෙව් සහ රෝම හමුදාව විසින් අත්අඩංගුවට ගෙන, කුරුසියේ ඇණ ගසනු ලබන බවත්, දින තුනකට පසු ඔහු නැවත නැගිටුවනු ලබන බවත් ය. ඔහු යේශුවාගේ මරණය හුදු අහඹු සිදුවීමක් නොවන බවත් මෙය ලෝ දනාගේ පව් සමාව සඳහා දෙවියන් වහන්සේගේ සැලැස්ම බවත් එය සත්‍ය වශයෙන්ම සිදු වූ බවත් පැවසීය. ඔහුගේ ගෝලයෙක් වූ යුදාස් මුදලට **යේශුවා** පාවා දුන් අතර **යේශුවා** ගැන ඔත්තු සපයන්නෙකු ලෙස කයා කළේ ය. යුදෙව් අධිකරණය විසින් **යේශුවා** තමා මෙසියස්, රජෙකු බවට ප්‍රකාශ කිරීම නිසා **යේශුවාව** වරදකරුවෙකු ලෙස මරණයට පත් කළේය. **යේශුවා** මිනිසුන් රෝම ආණ්ඩුවට බදු නොගෙවන ලෙසට අනුශාසනා කල බව පවසමින් ඔවුහු බොරු චෝදනා කළහ. ඉන්පසු සොරුන් දෙදෙනෙකු සමඟ කුරුසියේ ඇණ ගසා මරා දැමීමට **යේශුවාව** රෝම හමුදාවට භාර දෙන ලදී. හමුදා සොල්දාදුවන් **යේශුවාට** ලෝහ කැබලි සහිත කසයකින් 39 වතාවක් පහර දුන්හ. ඔවුහු උන්වහන්සේ නිර්වස්ත්‍ර කර, පොලු වලින් තලා, උන්වහන්සේට සරදම් කළහ. ඔහුගේ දෑත් සහ පාද ලී කුරුසියකට ඇණ ගැසූහ. ඔහු පැය 6 ක් කුරුසියේ එල්ලී දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ තමාව මරා දැමූ අයට සමාව දෙන ලෙසයි.

**යේශුවා** මහ හඬින් කතා කොට, "පියාණෙනි, ඔබේ අතට මම මාගේ ආත්මය භාර දෙමි." මෙය පවසා උන්වහන්සේ අවසන් හුස්ම හෙළුවේය.

සිදු වූ දේ දුටු හමුදාපතිවරයා දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින්, "සැබැවින් ම මොහු නිර්මල ශුද්ධාවන්තයෙකි" යැල්යි කී ය. මෙම කාරණය බලන්ට රැස්ව සිටි සියලු දෙනා සිදු වූ දේ දුටු විට ඔවුන් තම පපුවට ගසා ඉවතට ගියහ. නමුත් ගලීලයේ සිට ඔහු පසුපස ආ ස්ත්‍රීන් ඇතුළුව ඔහුව හඳුනන සියල්ලෝ ඈතින් සිට මේ දේවල් දෙස බලා සිටියහ.

දැන් ඔවුන්ගේ තීරණයට සහ ක්‍රියාවට එකඟ නොවූ, යහපත් අවංක මිනිසෙක් වූ රාජ සභාවේ සාමාජිකයෙකු වූ යෝසෙප් නම් මිනිසෙක් සිටියේය. ඔහු අරිමාතිය ගම්මානයෙන් පැමිණි අතර, ඔහුම දෙවියන් වහන්සේගේ රාජ්‍යය එනතුරු බලා සිටියේය. පිලාත් ළඟට ගොස් **යේශුවාගේ** දේහය ඉල්ලා සිටියේය. ඉන්පසු ඔහු එය බිමට ගෙන, සිහින් හණ(ලිනන්) රෙදිවලින් ඔතා, පර්වතයේ කැපූ සොහොන් ගෙයක එය තැබුවේය. එය එළඹෙන නිවාඩුව සඳහා සූදානම් වන දිනය වූ අතර පුර පසලොස්වක පොහෝය (සබත) ආරම්භ වීමට ආසන්න විය.

ගලීලයේ සිට **යේස්ශුවා** සමඟ පැමිණි ස්ත්‍රීන් යෝසෙප් පසුපස ගොස් සොහොන් ගෙය සහ ඔහුගේ දේහය එහි තැන්පත් කර ඇති ආකාරය දැක. ඉන්පසු ඔවුහු නිවසට ගොස් සුවඳ ද්‍රව්‍ය සහ සුවඳ විලවුන් පිළියෙළ කළහ.



## 8. නැවත නැඟිටීම
## ලූක් 24:1-8

සතියේ පළමුවෙනිදා උදෑසනම එම ස්ත්‍රීන් සූදානම් කළ සුවඳ ද්‍රව්‍ය රැගෙන සොහොන් ගෙය ළඟට ගියෝය. සොහොන් ගෙයින් ගල පෙරළී ඇති බව ඔවුන් දුටු නමුත් ඔවුන් ඇතුළු වූ විට **යේසුස්වාගේ** දේහය හමු නොවීය. ඔවුන් මේ ගැන කල්පනා කරමින් සිටියදී, හදිසියේම විදුලි ආලෝකය මෙන්

දිලිසෙන ඇඳුම් ඇඳගත් මිනිසුන් දෙදෙනෙක් ඔවුන් අසල සිට ගත්හ. එම ස්ත්‍රීන් භීතියෙන් හිස නමා සිටින විට එම මිනිසුන් දෙදෙනා ඔවුන්ට කතා කොට, "ඔබ ජීවමාන පුද්ගලයෙකු මළවුන් අතර සොයන්නේ මන්ද? ඔහු මෙහි නැත; ඔහු නැගිට ඇත! ඔහු ගලීලයේ ඔබ සමඟ සිටියදී ඔහු ඔබට පැවසූ දෙය මතක තබා ගන්න: 'මනුෂ්‍ය පුත්‍රයා **පෘතග්ජනයින්**(පව්කාරයන්)අතට පාවා දී, කුරුසියේ ඇණ ගසනු ලැබ තුන් වන දින නැවත නැගිටුවනු ලැබිය යුතු" බව පැවසුවෝය. එවිට උන්වහන්සේගේ වචන ඔවුන්ට මතක් විය.
**යේසුස්වා** තම ගෝලයන් අතරට පැමිණ, "ෂාලොම්(ඔබට සාමය)" කියා පැවසුවා. ඔවුන් තිගැස්සී බියට පත් වූයේ අවතාරයක් දුටු ලෙසිනි. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "බිය නොවන්න, මාගේ අත් සහ පාද දෙස බලන්න. මේ මමයි, ප්‍රේතයෙකුට මස් හා ඇට නැත මට ඇති බව ඔබ දකින පරිදි මාව ස්පර්ශ කර බලන්න" **යේසුස්වා** ඔවුන්ගෙන් අසමින්: "කෑමට යමක් නුඹලා ළඟ තිබේද?" ඔව්හු උන්වහන්සේට බැදපු මාළු දුන් අතර, උන්වහන්සේ ඔවුන් ඉදිරියෙහි එය කෑවේ ය. උන් වහන්සේ ඔවුන් සමඟ සිටියදී උන් වහන්සේ ඔවුන්ට මතක් කරමින් උන්වහන්සේව මරා දැමිය යුතු බවත් නැවන මළවුන්ගෙන් නැගිටුවනු ලබන බවත්, නැවත පැමිණීමට පෙර නිර්වාණ නගරයේ ඔවුන්ට ස්ථානයක් සූදානම් කිරීමටත් බව කියා සිටියේ ය.


9

## 9. යේෂුවා නිර්වාණ නගරයට නැඟී සියලු ජාතීන් වෙත යාමට ගෝලයන්ට නියෝග කරයි
## මතෙව් 28:16-20,
## ක්‍රියා 1:11

ගෝලයෝ ගලීලයේ **යේෂුවා** ඔවුන්ව මුලින්ම තෝරාගත් කන්දට ගියෝය. උන්වහන්සේ හදිසියේම ඔවුන්ට පෙනී සිටි අතර ඔව්හු උන්වහන්සේ ට නමස්කාර කළහ. "සියලු බලය මට දී ඇත, එබැවින් ඔබ සියලු ජාතීන් වෙත ගොස් ඔවුන් ගෝලයන් කරන්න. පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද සහ ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන්ව වතුරේ ගිල්වන්න. මාගේ සියලු අණපනත්වලට කීකරු වීමට ඔවුන්ට උගන්වන්න. මතක තබා ගන්න, මම සැමවිටම ඔබ සමඟ සිටිමි".

**යේෂුවා** මළවුන්ගෙන් උත්ථාන වූ පසු දින 40ක් මිහිමත සිටි සේක. උන්වහන්සේ තම ගෝලයන් සමඟ. දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන ඔවුන්ට උගන්වමින් කාලය ගත කළ සේක. උන්වහන්සේ තවත් බොහෝ දෙනෙකුට ද පෙනී සිටි සේක, වරක් 500 කට අධික පිරිසකටද උන්වහන්සේ පෙනි සිටි සේක.

ඉන්පසු උන්වහන්සේ තම ගෝලයන් ට මග පෙන්වමින් ඔලීව කන්දට රැගෙන ආසේක. "පියාණන්වහන්සේගෙන් පොරොන්දුව ලැබෙන තුරු යෙරුසලම හැර නොයන්න. යොහාන් වතුරේ මිනිසුන් ගිල්වමින් සිටි, නමුත් දැන් ඔබ ශුද්ධාත්මයාණන් තුළ ගිල්වනු ඇත. යේසුස් වහන්සේ **නිර්වාණ නගරයට** වඩින අයුරුඋන්වහන්සේගේ ගෝලයෝ බලා සිටියහ. එකෙණෙහිම **දේව දූතයෝ** දෙදෙනෙක් ඔවුන්ගෙන් ඇසුවේ, "ඇයි අහස දෙස නුඹලා බලන්නේ? නුඹලාගෙන් ඔසවා ගනු ලැබූ මේ **යේෂුවා** නුඹලා දුටු ආකාරයෙන්ම නැවත පැමිණෙනු ඇත.



## 10. යේෂුවා නිර්වාණ නගර රජ්‍ය
## එළිදරව් 21-12

**යේෂුවාගේ** ගෝලයෙකු වූ යොහන්ට **දේව දූතයෙක්** කතාකොට "එන්න, දේවයා මාව ආත්මයෙන් විශාල හා උස් කන්දකට ගෙන ගොස්, දෙවියන් වහන්සේගෙන් නිර්වාණයෙන් බැස එන ශුද්ධ නගරය වන යෙරුසලම මට පෙන්වීය. එය දෙවියන් වහන්සේගේ තේජසින් බැබළුණේ ය, එහි දීප්තිය ඉතා වටිනා මැණිකක් මෙන්ද, සූරියකාන්ත පාෂාණ මෙන්ද, පළිඟු මෙන්ද පැහැදිලි විය. එහි දොරටු දොළහක් සහිත මහා උස් පවුරක් ද, ඒ ඒ දොරටුවෙහි **දේව දූතයන්** දොළොසක් ද විය. දොරටු මත ඊශ්‍රායෙල් ගෝත්‍ර දොළොසෙහි නම් ලියා තිබිණ. නැගෙනහිරින් දොරටු තුනක් ද උතුරින් තුනක් ද දකුණෙන් තුනක් ද බටහිරින් තුනක් ද විය. මා සමඟ කතා කළ දේව දූතයා ට නගරය, එහි දොරටු සහ එහි බිත්ති මැනීමට රන් මිණුම් දණ්ඩක් තිබුණි. නගරය පුළුල් වූ තාක් දුරට චතුරස්‍රයක් මෙන් විය. ඔහු දණ්ඩෙන් නගරය මැන බලා එය සැතපුම් 1,500ක් දිගින් හා පළලින් හා උසින් යුක්ත බව සොයා ගත්තේය. නගරයේ මහා වීදිය රත්තරන් විය, විනිවිද පෙනෙන වීදුරු මෙන් පිරිසිදු විය ... නගරයට එය බැබලීමට ඉර හෝ සඳ අවශ්‍ය නොවේ, මන්ද දෙවියන් වහන්සේගේ මහිමය එයට ආලෝකය දෙන අතර **බැටළු පැටවා** එහි පහනයි. ජාතීන් එහි ආලෝකයෙන් ගමන් කරයි, පොළොවේ රජවරු ඔවුන්ගේ තේජස එයට ගෙන එයි. කිසි දිනක එහි දොරටු වැසෙන්නේ නැත, මක්නිසාද එහි රාත්‍රියක් නැත. ජාතීන්ගේ මහිමයත් ගෞරවයත් ඒ තුළට ගෙන එනු ලැබේ. **බැටළු පැටවාගේ** ජීවන පොතේ නම් ලියා ඇති අය පමණක් මිස අපිරිසිදු කිසිවෙක් එයට ඇතුල් නොවනු ඇත, නින්දිත හෝ වංචා කරන කිසිවෙක් එයට ඇතුල් නොවනු ඇත.

**යේෂුවා** සෑම කඳුළක්ම පිස දමනු ඇති අතර තවත් මරණයක් හෝ අසනීපයක් හෝ දුක් වේදනා ඇති නොවන්නේය.

එවිට කිසිවෙකුට ගණන් කළ නොහැකි විශාල ජනකායක් මම දුටුවෙමි, ඔවුන් උස් හඬින් අලුත් ගීතයක් ගායනා කළහ: "ඔබේ රුධිරයෙන් ඔබ සියලු ගෝත්‍රවලින්, භාෂාවන්ගෙන්, මිනිසුන්ගෙන් සහ ජාතීන්ගෙන් මිනිසුන් දෙවියන් වහන්සේට මිල දී ගත්තා. ඔබ ඔවුන්ව පූජකයන්ගේ සහ රජවරුන්ගේ රාජ්‍යයක් බවට පත් කළ සේක. එළිදරව් 5:9-10.

ඉක්බිති **දේව දූතයා** මට දෙවියන්ගේත් **බැටළු පැටවාගේත්** සිංහාසනයෙන් බැස නගරයේ මහා වීදිය මැදින් ගලා යන පළිඟු මෙන් පැහැදිලි ජීවන ජල ගංගාව මට පෙන්වීය. ආත්මයාණන් වහන්සේ, "එන්න! පිපාසයෙන් පෙළෙන තැනැත්තා පැමිණෙත්වා; කැමති තැනැත්තා ජීවන වතුර නොමිලයේ
ලබාගනිත්වා". ගං ඉවුර දෙපස ජීවන වෘක්ෂය එල දොළොසක් දරයි, මසකට එල දරයි, වෘක්ෂයේ කොළ ජාතීන්ගේ සුවය පිණිස පවතී.

ක්‍රිස්තු පිටකයේ මෙම කථා 10 බෞද්ධ සහ ක්‍රිස්තියානි සංස්කෘතීන් අතර අවබෝධය ඇති කිරීමට අදහස් කෙරේ. බුදුන් වහන්සේගේ සහ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ඉතා සමාන වන්නේ දෙකම

දයානුකම්පාව, දයාව සහ අන් අයගේ යහපත සඳහා තම ජීවිතය පූජා කිරීම අවධාරණය කරන බැවිනි. වරදවා වටහා ගැනීමට හේතු වූ සංකල්ප ලැයිස්තුවක් මෙන්න.

1. ස්වගර්ය පිළිබඳ සංකල්පය. විනාශය (අනිත්‍යභාවය vs ස්ථිරභාවය)

2. නැවත ඉපදීම සහ ස්වගර්යෙන් ඉපදීම යන සංකල්පය? බෞද්ධයන් නැවත ඉපදීමට කැමති නැත.

බුදුන් වහන්සේ මිනිසුන්ට පුනරුත්පත්තියේ චක්‍රයෙන් (සංසාරය) ගැලවීමට ඉගැන්වූ සේක

3. පූජාව සහ ජීවිතය පූජා කිරීම?

4. යුක්තිය සහ කෝපය?

5. අලුත් කිරීම (නැවත ඉපදීම) vs. පුනරුත්පත්තිය

6. කාමුක ප්‍රේමය vs. අනුකම්පාව

7. අපරාධය, නපුරු ආශාව හෝ පාපය?

8. බුදුන්ගේ හෝ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රමුඛත්වය? වැඩිමහල් කවුද?

9. කුසල් හෝ කරුණාව?

10. මැවීම vs. සදාකාලික අනීතික වාසස්ථාන?

11. විශ්වාසය එදිරිව දන්නා දේ කෙරෙහි විශ්වාසය

12. ඓතිහාසික වාර්ථා මත පදනම් වූ කථා හෝ මිථ්‍යාවන් / ප්‍රබන්ධ මත පදනම් වූ මූලධමර්.

“මක්නිසාද දෙවියන් වහන්සේ ලෝකයට කොතරම් ප්‍රේම කළාද යත්, ඔහු තම එකම පුත්‍රයා දුන් සේක, ඔහු කෙරෙහි විශ්වාස කරන ඕනෑම කෙනෙකුට

නැති නොවී සදාකාල ජීවනය ලැබෙනු ඇත.'' යොහන් 3:16. මුල් ඉරිදා පාසලේදී බොහෝ බටහිර කිතුනුවන් විසින් උගන්වන ලද එවැන්ජලිකල්
ක්‍රිස්තියානීන්ගේ මෙම ප්‍රමුඛ බයිබල් ශුද්ධ ලියවිල්ල මුල් ක්‍රිස්තියානි ළමා අධ්‍යාපනයේ මූලික
බයිබලානුකූල සංකල්ප සන්නිවේදනය කිරීමට අදහස් කරයි. කෙසේ වෙතත්, බෞද්ධයන් මෙම ශුද්ධ ලියවිල්ල කියවන්නේ
ඉතා වෙනස් ආකාරයකටය. ඔවුන් ගැලවීම පිළිබඳ ශුභාරංචිය අසන්නේ නැත, නමුත් දෙවියන් වහන්සේ කෙරෙහි කාමුක ප්‍රේමය ගැන,
නිරයේ විනාශ වීමට සමාන පුනරුත්පත්තියේ චක්‍රයට මඟ පාදන මිථ්‍යාවන් කෙරෙහි විශ්වාසය මත පදනම් වේ. බයිබලයේ කතුවරුන් සන්නිවේදනය කිරීමට අදහස් කරන
සම්පූර්ණ අර්ථයම
බෞද්ධ ලෝක දැක්ම තුළ ආපසු හරවා ඇත.
යොහන් 3:16 ශුභාරංචිය ලෙස තේරුම් නොගනී, එය බයිබලය හඳුන්වන ශුභාරංචිය
නමුත් නරක ආරංචියකි. බෞද්ධ කන්වලට වඩා හොඳ පරිවර්තනයක් විය හැක්කේ, "දෙවියන් වහන්සේට එතරම් මහා දයානුකම්පාවක් තිබුණා
ඔහු තම එකම හා අද්විතීය පුත්‍රයා පරිත්‍යාග කළේ ඔහු කෙරෙහි විශ්වාසය තබන ඕනෑම කෙනෙකුට සදාකාලික නිරයේ විනාශ නොවී ස්ථිර සදාකාලික ජීවිතයක් ලැබෙනු ඇත. යොහන් 3:16
බුරුමයේ (මියන්මාරයේ) සිට සම්මා පිටක බයිබලය පරිවතර්නයෙන්. සම්මා පිටක යනු බුරුම බයිබලයේ පළමු දේශීය පරිවර්ථනය වන අතර එය බුරුම පරිවර්ථන 15 ම ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස භාවිතා කරන ජඩ්සන් පරිවතර්නය මත රඳා නොපවතී.